# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**2023 වර්ෂයේ /61 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි**

## 2023-03-09

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
8. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
10. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
12. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
14. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
15. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා
16. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
17. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
18. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
20. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
21. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
22. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
23. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
25. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
26. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය

27. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
28. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
29. ගරු මන්ත්‍රීනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
30. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
31. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
32. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
33. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
34. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2023-02-09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

| |
|---|
| තීරණ අංක 01<br><br>2023-02-09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

පසුගිය මහා සභාවෙන් පැන නැඟී ඇති කරුණු තිබේදැයි ගරු සභාපතිතුමා ගරු මහා සභාවෙන් විමසා සිටින ලදී.

29 වන පිටුවේ තීරණ අංක 19 යටතේ සඳහන් කර ඇති මෝරුක්කුලිය සුනාමි ගම්මානය(නාමල් උයන) ව්‍යාපෘතියේ කැබලි අංක 37 ඉඩම් කොටස සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

ඒ පිළිබඳව පලාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ඉල්ලා ලිපියක් යොමු කර ඇති බව ගරු සභාපතිතුමා පැවසූ අතර පසුගිය මහා සභා තීරණ හා සාකච්ඡා කල කරුණු වලට අදාල ප්‍රගතියද ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

නුරාණි සුසාන භූමියේ ගස් කැපීම සම්බන්ධයෙන් කතා කිරීමේදී ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා පවසා සිටියේ සියළුම වාර්තා සහ ලිපි ලිඛිතව තිබිය යුතු බවයි.
සියළුම වාර්තා ලිඛිතව තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම නුරාණි සුසාන භූමිය පිළිබඳව කතා කිරීමේදී විශේෂයෙන්ම එම සුසාන භූමියේ භූමදාන කටයුතු සිදු කිරීමට ඉඩ නොමැති වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කල යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇල්බට් ඈෆ් පීරිස් ක්‍රීඩාංගණයේ බට වල අඩුපාඩුවක් තිබෙන බවත්,එය අයකර ගන්නේදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එය අය කර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

19 වන පිටුවේ පළමු ඡේදයේ තමන් කරුණක් සඳහන් කල බවත්,එහිදී ඉඩම් කට්ටි කිරීමේදී සහ ගොඩනැඟිලි අනුමත කිරීමේදී සභාව සතුව අනුමැතිය දී තිබෙන ලිපිය නොමැති බවත්,නමුත් එම අදාල පුද්ගලයා සතුව අනුමැතිය ලබා දී තිබෙන ලිපිය තිබෙන බවත් ඒ සම්බන්ධයෙන්ද පරීක්ෂණයක්ද කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා පවසා සිටින ලදී.එය ඉතාමත් විශ්වාසවන්ත පුද්ගලයෙකු පැවසූ බවත්,ඒ සම්බන්ධ වාර්තාවක්ද ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. අද දින මහා සභාව අවසන් මහා සභා වාරය විය හැකි බවත්, පක්ෂ වලට බෙදී ඡන්දයේදී වැඩ කටයුතු කලත් සියළු දෙනාම එක කණ්ඩායමක් ලෙස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ලෙස 2018-04-11 වන දින පළමු සභා වාරය පැවැත්වූ බවත්,එතැන් පටන් වසර 05ක් වැඩ කටයුතු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.විශාල වැඩ කොටසක් වෙන්නප්පුව පුරවරයේ ජනතාවට සිදු කල බවත්,කමිටු සභාපතිවරුන් ,උපසභාපතිතුමා ,විපක්ෂනායකවරුන් දෙපල සමඟ සියළුම දෙනා ජනතාවට අගනා සේවයක් සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.වෙනත් සභාවල නගර සභාවල සභාපතිවරුන් විවිධ චෝදනා වලට යන විට තමන් වෙන්නප්පුව ජනතාවගේ ආත්ම ගරුත්වය රැකගෙන, ජනතාව පීඩනයට පත් නොකර තමන් වැඩ කටයුතු සිදු කල බවත්,සියළු දෙනාගේම ආශිර්වාදයත් සමඟ අභිමානයක් ගෙන දීමට තමන්ට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. කොවිඩ්-19 සමයේදීද පක්ෂ පාට භේද නොබලා ජනතාවට අවශ්‍ය කරන බෙහෙත් ලබා දෙමින් සියළුම කටයුතු සිදු කල බවත් අප සියළුම දෙනා විශාල උනන්දුවකින් එකාමෙන් මහන්සි වී වැඩ කටයුතු කල බවත්,ඉන්පසුව අරගල සමයක් පැමිණි බවත්,පෞද්ගලික ගැටළු පසෙකින් තබා ජනතාව වෙනුවෙන් නොබියව වැඩ කටයුතු කල බවත්,තම නිවසට අරගලකරුවන් විසින් අලාභහානි සිදු කල අවස්ථාවේදීද තමන් එය පසෙකින් තබා කිරිමැටියන

උප කර්යාලයේ ගබඩා කර තිබූ යකඩ රැක ගැනීමට කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී.එලෙස ජනතාවගේ වැඩ කටයුතු සිදු කල බවත්,පසුගිය ධූර කාලය අවසන් වී යන විට ණය නැති සභාවක් බවට මෙම සභාව පරිවර්තනය කර ලබා දී ගිය බවත්,මේ වන විට කොටි 10 ක මුදලක්ද ස්ථාවර තැන්පතුවක තබා ඇති බවත් 2018 වර්ෂයේ පටන් ගැනීමේදී ලේකම් මහතා කෝටි 4ක පමණ මුදලක් ස්ථාවර තැන්පතුවක තබා තිබූ බවත් එමගින්ද විශාල වැඩ කොටසක් සිදු කල බවත් යහපාලන ආණ්ඩුවෙන් ලිහිරියාගම පොළ හා ලුණුවිල වෙළඳ සංකිර්ණයට මුදල් දෙන බවට පවසා තිබූ නමුත් මුදල් ලබා නොදුන් බවත් එම කටයුතු දෙකම තමන් පැමිණ සිදු කල අවසන් කල බවත් ප්‍රකාශ කරන ලදී.හිටපු සභාපතිවරුන් ගත් ණය සියල්ලම ගෙවා අවසන් කර ඇති බවත්,සෙන්දිරියාමුල්ල අංගණයේ වහලය දක්වා සියළුම ගෙවීම් අවසන් කර ඇති බවත්,මාර්ග වලින් කෝටි දෙකක පමණ මුදලක් අප සභවට අය වීමට තිබෙන බවත්,එබැවින් කතා කිරීමේදී මේවා පිළිබඳව සොයා බලා කතා කරන ලෙසත් පවසා සිටින ලදී.ආත්මගරුත්වයක් නොමැති වන ලෙස කතා නොකරන ලෙසටද ඉල්ලා සිටින ලදී.වරිපනම් ඒකකද පුළුල් කර ඇති බවත් එබැවින් විශාල මුදලක් එකතු වී මට තිබෙන බවත්,වෙන්නප්පුව ජනතාවට කරන්නාවූ මෙහෙවර හා වැඩ කොටස සිදු කර දී ඇති බවත්,එබැවින් නැවත පැමිණෙන මන්ත්‍රීවරුන්ට වැඩ කල හැකි පරිදි සියල්ල නිර්මාණය කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.2023-03-18 වන දින නගර ශාලාව නිල වශයෙන් විවෘත කරන බවද ඒ සඳහා ආරාධනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.නගර ශාලාවේ ඉතිරි වැඩ කටයුතු වලට කෝටි 10ක 12 ක පමණ මුදලක් අවශ්‍ය බවත්,නමුත් අනෙක් කටයුතු අවසන් කර ඇති බැවින් හැකි අයුරින් එය භුක්ති විඳීමට හැකි ලෙස සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මාර්ග වල වැඩ කටයුතු ,ආගමික ස්ථාන වල වැඩ කටයුතු,පාසල් 44ක,රෝහල් වල වැඩ කටයුතු මේ සියල්ල සමඟ සිදු කර දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ක්‍රීඩා පිටි සංවර්ධනය කර දී ඇති බවත්,ආදායම් මාර්ග සම්බන්දයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හෝ අඩුපාඩු පෙන්වා දෙන විට ඒවා සකස් කර ගෙන ඉදිරියටම ගිය බවත්,පෙර පාසල් පද්ධතියද මෙහෙයවමින් ඉදිරියට ගෙන ගිය බවත් ළමුන් 280-300 පමණ සිටින දන්කොටුව පෙර පාසල වැනි පෙර පාසල්ද නිර්මාණය කල බවත් ප්‍රකාශ කරන ලදී.ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයද ඉදිරියටම ගෙන යමින් එම වැඩ කටයුතු වලටද දායකත්වය ලබා දුන් බවත්,කමිටු සභාපතිවරුන් ඇතුළු කමිටු සාමාජිකයින් සමඟ එම වැඩ කටයුතු සියල්ලම සිදු කල බවත් එබැවින් සියළුම දෙනාට ස්තූතිය පුද කරමින් තම කතාව අවසන් කරන ලදී.ඊළඟ මැතිවරණයට තරඟකරන සියළුම දෙනාටද සුභ පැතුම්ද එක් කරන ලදී.

02. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

1. ගරු මන්ත්රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
2. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
3. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
7. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය

මහා සභා රැස්වීමට සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරයාගේ හා ගරු මන්ත්‍රීවරියගේ නිවාඩු ගරු මහා සභාව අනුමත නොකරන ලදී.

8. ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
9. ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2023 වර්ෂයේ පෙබරවාරි මස සහ මාර්තු මස පැවති පහත සදහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2023 පෙබරවාරි මස 14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **5.** | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **7.** | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **8.** | ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2023 පෙබරවාරි මස 17 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **5.** | ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය |
| **6.** | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා |
| **7.** | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |
| **8.** | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා |

**2023 පෙබරවාරි මස 23 වන දින පැවති පරිසර සහ මහජන පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **4.** | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| **5.** | ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා |
| **6.** | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |
| **7.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |

**2023 පෙබරවාරි මස 03 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 02 | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |

| | |
|---|---|
| 03 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 04 | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 05 | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 06 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2023 පෙබරවාරි මස 17 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | අ/අ |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 02 | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 03 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 04 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා |
| 05 | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 06 | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 07 | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 08 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2023 මාර්තු මස 02 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 02 | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 03 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 04 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 05 | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 06 | ගරු මන්ත්‍රීනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 07 | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

03. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහනක් 2023-03-02 වන දින ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දුන් විශ්‍රාමික ලේකම් පෝල් ප්‍රනාන්දු මහතාට සහ ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

04. වෙන්නප්පුව නගරයේ කාණු පද්ධතියේ පස් ඉවත් කිරීමේ ශ්‍රමදානයක් පසුගිය දින පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී

05. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් පවත්වන ලද දෙමළ භාෂා පුහුණු වැඩසටහනේ සහතික ප්‍රධානය කිරීමේ උත්සවය පෙබරවාරි 20 වන දින පවත්වන්නට කටයුතු කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී

06. 2023-02-11 වන දින කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මහත්මියගේ ප්‍රධානත්වයෙන් උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන පැවැත්වූ බවත් ඒ සඳහා අප සභාවටද සහභාගී වීමට අවස්ථාවක් හිමි විය.

07. කිරිමැටියාන නගරයේ කාණු පද්ධතිය පවිත්‍ර කිරීමේ වැඩසටහන වෙන්නප්පුව ප්‍රදේශීය සභාවේ මෙහයෙවීමෙන් 2023-02-10 වන දින ක්‍රියාත්මක කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී

08. අබලි භාණ්ඩ වෙන්දේසිය 2023-03-13 වන දින පෙ.ව.10.00 කම්මල්පත්තුව උප කාර්යාලයේදී සිදු කරන බව දැනුම් දෙන ලදී.

09. ලුණුවිල,උ/කිරිමැටියාන ප්‍රදේශයේ පදිංචි ඩබ්.ඒ.ඩී.ගයාන් සමීර මහතා විසින් ලුණුවිල වාණිජ ගොඩනැගිල්ලේ උඩුමහල කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බදු ලබා ගැනීමට අදාල ලිපිය සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 04<br><br>මුදල් කමිටුවේදී ගෙන තිබූ තීරණය අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. |

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. නයිනමඩම කෝප් සිටිය සඳහා විදුලි සැපයුම් ධාරිතාවය වැඩි කිරීම සඳහා තීරණයක් ගැනීමට අදාලව ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව මුදල් කමිටුවේදීද සවිස්තරව සාකච්ඡා කල බව ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

මෙම රු.1,440,000.00 අප විසින් ගෙවිය යුතු දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

ඔවුන් ගෙවන බවත්,නමුත් අප විසින් ලබන වසරේ සිට මුදල් පියවී යන ලෙසට වසර 05කින් වාරික මුදල් අඩු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම නිසා මෙම අයවැයට කිසිඳු ගැටළුවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.වසර 05 ඇතුළත නව තක්සේරුවක් පැමිණියහොත් එය ගෙවන බවට ඔවුන් පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඔවුන් විසින් ලිපියක්ද එවා ඇති බවත්,මෙම කටයුත්ත ඉතාමත් පැහැදිලිව සිදු කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඔවුන් ලක්ෂ 15ක් ලබා දී විදුලිය ලබා ගන්නා බවත්,මෙවර අයවැයට ඔවුන්ගේ කඩ කුලිය ඇතුලත් කර ඇති බැවින් එය ඊළඟ වසරේ සිට අඩුකරගෙන යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය අවසන් මහා සභාව විය හැකි බවත්,තක්සේරුව වැඩි වුවහොත් එයට යටත්ව මෙය සිදු කල යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම ලිපියේ තිබෙන කාරණයක් සම්බන්ධයෙන් සභාවේ ලිපි ගොණුවට කඩදාසියක් අමුණා ගැනීමට තිබෙන බවත්,“ ඉහත නව කඩකාමරය සමූපාකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත රු.5,541,117.00ක වියදමක් යටතේ සමිතිය විසින් නවීකරණය කරන ලදී.” ලෙස සඳහන් කර ඇති බවත් එසේ නම් ඒ සඳහාද මහා සභාවක එකඟතාවයක් තිබිය යුතු බවත් මෙම ලිපි ගොණුව සකස් කරන ලෙසත් අඩුම තරමින් එය සිදු වි තිබේද යන්නවත් සොයා බලා වාර්තාවක් ලබා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පවසා සිටින ලදී.

සමුපාකාරයට කතා කර ලිපි නොමැති නවීකරණය වැනි කටයුතු සඳහා ලිපි ලබාගෙන ගොනුව සකස් කරන ලෙසත්,මහා සභා අනුමැතියන්ද එකතු කර එක් ගොණුවක් මෙම කටයුත්ත සඳහා පවත්වාගෙන යන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය ව්‍යාපාරික ආයතනය තුල නවීකරණය කටයුත්තකට එම මුදලට යන්නට ඇතැයිද,ගොඩනැගිල්ලේ වෙනසක් සිදු වී නොමැති යැයි තමන් සිතනා බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම ගොඩනැගිල්ල පුළුල් වූ බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන්ද දැනට පවතින තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එය සභාවට අයත් භූමියක් බැවින්,මේ සඳහා අප නිලධාරීන් විසින් ඇස්තමේන්තු අනුමත කර තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

සභාවේ තාක්ෂණ නිලධාරීන් නොව පලාත් ඉංජිනේරු කාර්යාලයේ වරලත් ඉංජිනේරු මහතෙකු විසින් ඇස්තමේන්තුව සහතික කර තිබූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය සභාවේ ප්‍රාග්ධනය බවත්,මේ පිළිබඳ සභාවේ වාර්තාවක් තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව තමන් ලිපි ගොණුව පරීක්ෂා කර බැලූ බවත්,මොවුන් පළමු ඉල්ලීම 2020 සිදු කර ඇති බවත්,එම ලිපියේ ඔවුන් විදුලි සැපයුම ගැනීමට කැමති බවට සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේද අනුමැතිය ගැනීමට සිදු වන බවත්, පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මෙය නිරීක්ෂණයට පැමිණෙන විට එම මුල් ලිපියේ ගැටළුවක් මතු වන බවත්, ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා පැවසූ පරිදි ගොඩනැගිල්ල සඳහා අනුමැතිය ගැනීම එම ගොණුවේ නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

එම ලිපිය සභාගත කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ඉල්ලා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර විෂයභාර නිලධාරී ජේ.ඒ.ඩී.ඒ්.පී.ඒස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම ලිපිය විෂයභාර නිලධාරී අත තිබූ බැවින් එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ලිපිය කියවා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහි තක්සේරුව අප සභාවේ ආදායම් පරීක්ෂක හරහා ගෙන ඇති බැවින් ඒ සඳහා රජයේ තක්සේරුවක් ගැනීමට සිදු වන බවද ලේකම් මහතා පවසා සිටින ලදී. මොවුන්ගේ අවශ්‍යතාවයට පුළුල් කිරීමක් කර තිබෙන බවත්,ඒමෙන්ම වසර 04ක් පමණ ගාස්තුව අය නොකර හිලව් කරන බැවින් කොමසාරිස්තුමා අනුමැතිය ලබා දේ දැයි තමන් නොදන්නා බවත් පවසා සිටින ලදී.

එදා ඉල්ලූ ලිපියට ද සමුපාකාර කොමසාරිස් අනුමැතිය ලබා දී ඇති බැවින් මෙදින ඉල්ලන ලිපියටද සමුපාකාර කොමසාරිස් සහ පලාත් පාලන කොමසාරිස් එකඟතාවය පල කරන බවත් මෙමඟින් මන්ත්‍රීවරුන් නිදහස් කර අනුමැතියට යවමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්. ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ඒම ඉදිරිපත් කර තිබෙන ලිපියේ පස්වන ඡේදය පැහැදිලි කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.එම සාකච්ඡාව

සිදු කල මුදල් කමිටුවේ තමන් නොසිටි බවත්, අනෙකුත් ආයතන වලට නොමැති වරප්‍රසාදයක්ද මොවුන්ට ලබා දී ඇති බවත්, රු.24,000ක බැගින් වසර 5ක් ලබා දීමට ගියහොත් අනවශ්‍යය දෙයක් බවත් ප්‍රකාශ කරන ලදී.

සියළුම ආයතන ජනතාවට සේවය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් පසුගිය කාලයේ QR Code නොමැතිව මන්ත්‍රීවරුන්ට හෝ සභාවට වාහන වලට තෙල් ලබා නොදුන් බවත් ගරු මන්ත්‍රී ඩබ්. ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කවුරුන් කෙසේ කීවත් සමුපාකාරය මහජනතාවට විශාල සේවයක් සිදු කරන ආයතනයක් බවත් ,මොවුන්ව දෙවරක් ගෙන්වා සාකච්ඡා කල බවත්, එම නිසා මේ සඳහා අනුමැතිය ලබා දෙමුයැයිද ගරු මන්ත්‍රී යූ. ජුඩ් ජ්මමානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව මෙය ලබා දෙමුයැයිද ,සමුපාකාරය යනු වෙන්නප්පුවේ අප ප්‍රදේශයේ සහෝදර ආයතනයක් බවත්, ඒක් ඒක් කෙනාගේ හිතවත්කම් මත තෙල් අර්බුදය අවස්ථාවේදී තෙල් ගසා ගත් බවත්,බොහෝ දෙනෙකුට තෙල් ගසා දුන් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් එය ප්‍රතික්ෂේප කරන බවත් තමන්ට කිසිඳු සහයෝගයක් ලබා දී නොමැති බවත් ගරු මන්ත්‍රී ඩබ්. ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශයේ ජනතාවට සේවය කරන ආයතන දෙකක් අතර මෙම ගැටළුව තිබෙන බවත්,යම් තාක්ෂණික ගැටළු තකීපයක් තිබෙන බවත්, ඒම තාක්ෂණික ගැටළු කීපය විසඳාගෙන ,පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව මෙය ලබා දෙමුයැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව සමුපාකාරය රටේ අර්බුදයක් සිදු වන සෑම විටම පිහිට වන ආයතනයක් බවත්,මෙම නයිනමඩම කෝප් සිටිය තරහකාරී තත්ත්වයකට සාදා ඇති බවත්,ඒ් සඳහා සභාවෙන්ද දායකත්වයක්ද ලබා දිය යුතු බවත්,සමුපාකාරය සඳලංකාව ප්‍රදේශයෙන් ආරම්භ වූ බවත්,විගණනයට යා නොහැකි බැවින් සියළුම දේ බේරාගෙන මෙම කටයුතු සිදු කරන ලෙසත් ,පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියද මේ සඳහා ගෙන ඉදිරි කටයුතු සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

වැය කරන මුදලේ අවසන් ලිපි ගොනුවේ ට්‍රාන්ස්ෆෝමරයේ අයිතිය සටහන් කරගතහොත් හොඳයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

දැනට රු.24,000.00 ක මුදලක් යටතේ මෙම කඩ කාමර දෙක ලබා දී ඇති බවත්,එය සහන මිලක් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සභාව විශාල සහයෝගයක් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 05

මේ සඳහා මුදල් කමිටුවේදී ගෙන ඇති තීරණය පරිදි 2024-01-01 වන දින සිට ඉදිරි වර්ෂ 05කින් අදාල විදුලි සැපයුම් ගාස්තුවෙන් රු.24,000.00x60 =1,440,000.00ක මුදලක් පියවී යන පරිදි එම කාලය තුළ රු.24,000.00ක මාසික කුලිය අය නොකර සිටීමට හා එම කාලය අතරතුර යම් කුලී ගාස්තු නව තක්සේරුවක් වෙතොත් එම වැඩිවන ප්‍රමාණය පමණක් අය කිරීමටද 2029-01-01 සිට සමස්ථ කුලිය නැවත අය කිරීම ආරම්භ කිරීම සුදුසු බවටත්,මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. සේවක පුරප්පාඩු සඳහා නැවත බඳවා ගැනීම සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අනුමැතිය ලබාගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

සේවකයින් 14 දෙනෙකු මෙම මස කීපය ඇතුළත සභාවෙන් ඉවත් වී ගෙ ාස් ඇති බවත්,පුස්තකාල වල වැඩ කටයුතු පුරප්පාඩු තබාගෙන හෝ අපහසුවෙන් කරගෙන යා හැකි නමුත් සෞඛ්‍ය අංශය සඳහා කම්කරුවන් අවශ්‍ය බවත්,කසල එකතු කිරීමට සේවකයින් අත්‍යවශ්‍ය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම කසල බදු එක්රැස් කල දෙදෙනෙකුද ඉවත් වී ගොස් ඇති බවත් ඒ සඳහාද අවසරය ලබාදෙන ලෙසත් නැතිනම් වැඩ කටයුතු සිදු කර ගැනීමට අපහසු බවත් ප්‍රකාශ කරන ලදී.

කසල බදු අය කරන විට රිසිට් පතක් නිකුත් කරන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.එසේ නම් පුස්තකාල සහයක තිදෙනා මෙමඟින් ඉවත් කර ගන්නේදැයිද විමසා සිටින ලදී.මොවුන් කුමන පුස්තකාල වල සේවය කලේදැයිද විමසා සිටින ලදී.

මොවුන් වෙන්නප්පුව,කම්මල්පත්තුව හා කිරිමැටියාන යන පුස්තකාල වල සේවය කල බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මොවුන් තිදෙනා බඳවා ගැනීමට සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගන්නා ලෙස සිදු කල නොහැකි බවත් ,එම ක්‍රියාපටිපාටියට අනුව සිදු කල යුතු බවත් ,විනිවිද භාවයකින් යුතුව සිදු කල යුතු බවත්,සෞඛ්‍ය කම්කරුවන්ද දන්කොටුවෙන් බඳවාගෙන වෙන්නප්පුවේ සේවයට යොමු කලහොත් ඔවුන් සේවයට නොපැමිණෙන බවත් එය සුදුසු පරිදි සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.බල ප්‍රදේශයට සේවයක් සිදු වන බැවින් සේවකයින් එකම තැනකින් බඳවාගෙන සේවයට දමනවාට වඩා ඒ ඒ සුදුසුකම් අනුව බඳවා ගන්නේ නම් මෙය වෙන්නප්පුව ආසනය පුරාම විසිරී යාවියැයිද,ගමන් දුෂ්කරතා මත සේවකයින් ඉවත් වීම සාමාන්‍ය දෙයක් බවත් ප්‍රකාශ කරන ලදී.සභාවේ අතිරික්ත සේවකයින් එකසිය ගණනකට මේ වන විට පඩි ගෙවන බවත්,එම සේවකයින්ද පුළු පූළුවන් ස්ථාන වලට යොමු කරන ලෙසත්,යම් සේවකයින් අදාල කාර්යය සිදු නොකරන බවත් යම් සේවකයින් අත්සන් කර නිවෙස් වලට යන බවත් නමුත් පඩිය ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.දැනට සිටින සේවකයින්ගෙන්ම වැඩ කටයුතු සිදු කරගෙන සභාවට වැය වන මුදල ද ඉතිරිකර ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.මේ පිළිබඳවද සැලකිලිමත් වන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ඡන්දය අවසන් වී ලේකම් මහතා පුස්තකාල සඳහා බඳවා ගැනීම සිදු කරාවියැයිද,නමුත් අනෙක් පිරිස අද හෙටම ගැනීමට සිදු වන බවත්,නැතිනම් සභාවේ කටයුතු සිදු කරගෙන යාමට අපහසු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට සියළුම බඳවා ගැනීම් නවතා ඇති බැවින්,පවතින නීති රීති අනුව මෙම කටයුතු ඉදිරියට සිදු කරගෙන යන ලෙසත් නැතිනම් ගැටළු වලට මුණ දීමට සිදු වේයැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය කලමනාකරණය කර ගැනීමට සිදු වන බවත්,ජංගම පුස්තකාල රථයේ සහයක ලෙස ගීත් නිර්මාල් මයා වැඩ කටයුතු සිදු කරන බවත්,එම මහතා විදෙස්ගත වීම සඳහා ඉල්ලා අස් වීමේ ලිපි අදාල පරිපාලන අංශය වෙත යොමු කර තිබෙන බවත් එබැවින් ඒ සඳහා සේවකයෙකු බඳවා ගැනීම අත්‍යවශ්‍ය බවත් ජංගම පුස්තකාල රථය නිවාඩු දින වල දහම් පාසල් පන්සල් දේවස්ථාන ආදී ස්ථාන වලට කාල සටහන අනුව ගමන් කරන බවත්,එමෙන්ම වෙන්නප්පුව පුස්තකාලයේ සේවය කල භාග්‍යා ලක්මිණි මිය විදෙස්ගත වීමේ අපේක්ෂාවෙන් ඉවත් වී ඇති බවත්,එමෙන්ම ෂාමල් මධූක මයා ආයුර්වේද සහයක බවත්,කළුවච්චිමුල්ල ආයුර්වේදය සඳහා සහයකයෙකු නොමැති වී ඇති බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.අවශ්‍යතතතාවය සඳහන් කර සභා අනුමැතියද සඳහන් කර යවන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

විදෙස් ගත වන චක්‍රෙල්ඛයේ විදෙස් ගත වන සේවයින් දැනට සිටින සේවකයින්ගෙන් කලමනාකරණය කරගෙන කටයුතු සිදු කරන ලෙසට සඳහන් කර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙයට අමතරව කොමසාරිස්තුමාට යවන ලිපියේ වෙන්නප්පුව පුස්තකාලයේ සේවය කල නිරාශා ජීවන්ති මහත්මියට අනුප්‍රාප්තිකයෙකු ලබා නොදුන් බවත්,එමෙන්ම ලුණුවිල පුස්තකාලයේ සේවය කල සුමිත්‍රා මහත්මිය විශ්‍රාමගත වුවත් අද වන තෙක් නිලධාරියෙකු ලබා නොදුන් බවත් ,එමෙන්ම ලුණුවිල පුස්තකාලයේ සේවය කල සාරංගා මහත්මිය සඳහාද නිලධාරියෙකු ලබා දී නොමැති බවත් එයද සඳහන්

කර යවන ලෙසට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.සේවකයින් හත් දෙනෙකුගේ හිඟයද ඇතිව කාර්ය මණ්ඩලය ලේකම්තුමා හසුරුවා ගන්නා බවත් ,මෙය කලමනාකරණයේදී සේවකයෙකු නිවාඩු ගත් විට ගෝනවිල,බුජ්ජම්පල වැනි ස්ථාන වැසීමට සිදු වන බවත්,එමෙන්ම මේ වන විට ස්ථාන දෙකක ප්‍රසූත නිවාඩු ගොස් ඇති බවත් මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉන් පසුව අදාල නීති රීති අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

චක්‍රලේඛ අංක 20හි “ රජයට සහ රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්,සේවකයන් බඳවා ගැනීම/උසස් කිරීම/මාරු කිරීම සීමා කීරීම “ ලෙස සඳහන් වන බවත්,තමන් සෑම විටම සේවකයින්ට එක්කෝටි විසි දෙලක්ෂයක් වැය වන බවද පවසන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.බොහෝ කාර්යාල වල සේවකයින් අත්සන් කර නිවෙස් වලට යන බවත් විශේෂයෙන් එය කිරිමැටියාන උප කාර්යාලයේ සිදු වන බවත් මෙවැනි තොරතුරු ජනතාව විසින් ගෙන එන විට සේවකයින් බඳවා ගැනීම වෙනුවට සිටින සේවකයින් යොදවා මෙම කටයුතු කාර්යක්ෂම කිරීම සුදුසු වන බවද ප්‍රකාශ කරන ලදී.

උදෑසනම රාජකාරියට පැමිණෙන සේවකයින් වේලාව අවසන් වූ පසුව දහවල් නිවෙසට යන බවත් නැවතත් ඔවුන්ව වෙනත් රාජකාරී වලට යෙදවුවද ඔවන් නොසිටින බවත්,සෞඛ්‍ය ක්ෂේත්‍රයට වැඩ කිරීමට පත්වීම් 25ක් පැමිණි විට ඔවුන්ව කොම්පෝස්ට් අංගණයට යෙදවූ බවත් නමුත් ඔවුන් ඉවත් වී යාමට ගිය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය කලමනාකරණය කරගත යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ජනපදයේ දහය කොටස පුස්තකාලයේ දෙදෙනෙකු සේවය කරන බවත් වැඩක් නොකර සිටින බවට පැමිණිලි පැමිණෙන බවත්,එක් කෙනෙකුගෙන් එය කලමනාකරණය කර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී

එතැන ජනපදය බැවින් එක් කාන්තාවක් පමණක් තැබීම සුදුසු නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෞඛ්‍ය අංශයට සේවකයින් ගැනීම ගැටළුවක් නොවන බවත්,අනෙක් අංශ සඳහා සේවකයින් ගැනීමේදී නැවතත් සිතා බන ලෙසත්,දැනටත් සේවකයින් අතිරික්තව සිටින බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පුස්තකාල සහායක වැනි තනතුරු සඳහා බඳවා ගැනීමේදී මෙතුවක් කල් විනිවිදභාවයකින් තොරව එම කටයුතු සිදු කර ඇති බවත් ඒ සඳහා වෙන්නප්පුව ආසනය තුළ සිටින සියළුම දෙනාට අයිතිවාසිකමක් තිබෙන බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවීමක් කර අධ්‍යාපන සුදුසුකම් මත පත් කර ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී. කම්කරු ලෙස ගත් කොටස තුළ කම්කරු සේවයේ නොයෙදෙන පිරිසක් මෙහි සිටින බවත් මෙම ගැටළු සඳහා ඔවුන්ව ගලපා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

පලාත් පාලන මැතිවරණ වලට අදාල චක්‍රලේඛ මහා සභා වාර්තාව සමඟ එවා ඇති බවත්,ඒත් සමඟම බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියක් සම්බන්ධයෙන්ද මෙහි සාකච්ඡා කල බවත්,ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.මෙම යෝජනාවට සම්බන්ධ ඇමුණුම අද දින ලැබුණ බවත්,එය වාර්තාව සමඟ පැමිණියේ නම් මේ සම්බන්ධව හැදෑරීමක් කරගෙන පැමිණීමට තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.එම මැතිවරණයට අදාල චක්‍රලේඛ සඳහාමෙය අදාල වේදැයිද විමසා සිටින ලදී.

තමන් විශේෂයෙන්ම සෞඛ්‍ය අංශය ගැන පැවසූ බවත්,අත්‍යවශ්‍ය කටයුත්තක් නම් මෙය සිදු කර ගැනීමට සිදු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මැතිවරණ කාල සීමාව තුළ මේ පිළිබඳව අවසන් නිගමනය කොමසාරිස්තුමාගෙන් ගැනීමට සිදු වන බවත් ,සේවා අවශ්‍යතාවය මත එම නිර්දේශය මත මෙම කටයුත්ත සිදු කර ගැනීමට සිදු වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සිදු කරනුයේ පරිපාලන කටයුත්තක් සඳහා අනුමැතිය ලබා දීම බවත්,බඳවා ගැනීමේ ක්‍රියාවලිය මින් අනතුරුව සිදු වන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි මාතෘකාව බඳවා ගැනීම බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

නමුත් මෙහිදී මේ සඳහා අනුමැතිය ලබා දීම පමණක් සිදු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා යම් සේවකයින් මෙහි පැමිණ අත්සන් කර නිවෙස් වලට යන බවට මෙහිදි ප්‍රකාශයක් සිදු කල බවත්,මේවා මහජනතාවගේ මුදල් බවත් ඒ පිළිබඳව විමසා සිටින ලදී.

මෙය තමන්ගේ පෞද්ගලික අදහසක් බවත්,තමන් එය සභාවේ නිලදාරීන් දැනුවත්ව සිදු කරන දෙයක් ලෙස නොපැවසුව බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ලේකම් මහතා මේ පිළිබඳව අවශ්‍ය පියවර ගන්නා බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06

සේවක පුරප්පාඩු සඳහා නැවත බඳවා ගැනීම සම්බන්ධයෙන් ගරු මහා සභාව දීර්ඝව සාකච්ඡා කරන ලදී.ඒ අනුව පහත සඳහන් කර ඇති සේවක මහත්මීන් සේවය හැර ගොස් ඇති බැවින් පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නැවතත් සේවකයින් බඳවා ගෙන සභාවේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සුදුසු බවත්,මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

| අ/අ | නම | සේවය කල ස්ථානය | තනතුර | සේවය හැර ගිය දිනය |
|---|---|---|---|---|
| 1. | එල්.ඩබ්.ජගත් ද මැල් මයා | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2022-04-01 |
| 2. | එම්.ජී.අමිල ප්‍රසන්න මයා | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2022-02-01 |
| 3. | ඩී.ප්‍රියංකර මයා | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2022-02-01 |
| 4. | ආර්.රගුවර් මයා | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2023-01-03 |
| 5. | පී.පාර්වතී මිය | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2022-08-19 සිට විශ්‍රාම |
| 6. | එස්.සිවනෙ ්ශ්වරන් මයා | සෞඛ්‍ය අංශය | සෞඛ්‍ය කම්කරු | 2023-02-02 |
| 7. | ප්‍රසාද් සංජීව මයා | කිරිමැටියාන කොම්පෝස්ට් අංගණය | සෞඛ්‍ය කම්කරු | 2022 දෙසැම්බර් මස සිට |
| 8. | සන්දීප් දිල්ෂාන් මයා | කිරිමැටියාන කොම්පෝස්ට් අංගණය | සෞඛ්‍ය කම්කරු | 2022 දෙසැම්බර් මස සිට |
| 9. | ගීත් නිර්මාල් මයා | පුස්තකාල | පුස්තකාල සහයක | 2023-02-06 |
| 10 | භාග්‍යා ලක්මිණි මිය | පුස්තකාල | පුස්තකාල සහයක | 2023-03-01 |
| 11 | ෂාමල් මදූක මයා | ආයුර්වේද | ආයුර්වේද සහයක | 2022-09-26 |
| 12 | ඩබ්.විනෝද් සංජීව මයා | කම්මල්පත්තුව උප කාර්යාලය(කසල බදු අය කිරීම) | ඍජු කොන්ත්‍රාත් | 2022-12-01 |
| 13 | හසිත කුමාර බාලසූරිය | කම්මල්පත්තුව උප | ඍජු කොන්ත්‍රාත් | 2022-12-01 |

| | | | | |
|---|---|---|---|---|
| | මයා | කාර්යාලය(කසල බදු අය කිරීම) | | |
| 14 | ටී.එම්.ඩී.සුදම් පසිඳු පීරිස් මයා | විදුලි අංශය | සෞඛ්‍ය කම්කරු | 2023 පෙබරවාරි මස සිට |

iii. 2023 ජනවාරි මස සිට ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ යෝගා පුහුණුව සඳහා අයකරනු ලබන ගාස්තුව අඩු කිරීම සඳහා තීරණයක් ගැනීමට අදාලව ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා ගාස්තුව වැඩි කිරීම සුදුසු නොවන බවත්,සුළු පිරිසක් පැමිණ මෙය සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ගාස්තු පැනවීම අනුව මොවුන්ගෙන් රු.1000.00 මුදලක් පැයක් සඳහා අය කර ඇති බවත්,එහිදී මොවුන් දිනකට පැය තුනක් පමණ මේ සඳහා යොදා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.සතියකට දින දෙකක් පමන සිදු කරන බැවින් සතියට රු6000.00ක් පමණ මොවුන්ගෙන් අයකර ගැනීමට සිදු වන බවත්,මින් පෙර රු.4500.00ක පමණ මුදලක් අය කරගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

අප විසින් මොවුන් සඳහා සේවා සැපයිය යුතු බවත්,විදුලි බලය ලබා දිය යුතු බවත් නඩත්තු කටයුතු සිදු කල යුතු බවත් මෙම කාර්යය ගෘහස්ථ ක්‍රීඩාංගණය තුළම සිදු කල යුතුදැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

නිශ්ශබ්දතාවය රැකෙන ලෙස එය සිදු කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා කී දෙනෙකු සහභාගී වන්නේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

පස් හයදෙනෙකු සහභාගී වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.රු.4500.00ක මුදලම ඔවුන්ගෙන් ලබා ගනිමුයැයිද ප්‍රකාශ කරන ලදී.

එසේ නම් රු.5000.00කට මොවුන්ට ලබා දෙමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.නැතිනම් අනෙක් ක්‍රීඩා සමාජද ගාස්තු අඩු කර ගැනීම සඳහා යොමුවේයැයිද ප්‍රකාශ කරන ලදී.

ක්‍රීඩා කමිටුවෙන් මේ පිළිබඳව සවිස්තරාත්මකව සොයා ක්‍රීඩාංගණයට පාඩුයැයි පවසා මෙම මුදල් වැඩි කල බවත්,එසේ සිදු කර නැවතත් එම මිල ගණන් අඩු කර ගැනීමට සභාවට යෝජනාවක් ගෙන එන බවත් ගරු මන්ත්‍රි ටී.බී.ඩී.ඇන්ටනී ක්‍රමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

අරගලයෙන්ද සහන ඉල්ලා සිටින බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දිගින් දිගටම එක් එක් ක්‍රීඩා සඳහා ගාස්තු සංශෝධනය කරගෙන යන බැවින් පොදු තීන්දුවක් ගෙන මෙම වසරේත් පසුගිය වසරේ ගාස්තුවම අය කර ගැනීමට කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මෙය දැනගත් වහාම ඊළඟ ක්‍රීඩා සංගම්ද පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ පිළිබඳව ගරු මන්ත්‍රිවරුන් අදහස් පල කරන ලදී.

මීගමුව මහා නගර සභාවෙන් කසල එකතු කිරීමට මාසයකට එක් හෝටලයකින් රු.5000.00ක මුදලක් අය කරන බවත් එලෙස ඔවුන් ආදායම වැඩි කර ගන්නා බවත්,එබැවින් මෙලෙස සහන ලබා නොදෙන ලෙස ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07<br><br>මේ පිළිබඳව සලකා බැලූ ගරු මහා සභාව රු.5000.00ක ගාස්තුවක් අය කිරීම සුදුසු බවට සාකච්ඡා කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා විසින් මාසික ගාස්තුව ලෙස මෙම ක්‍රීඩාංගණයේ යෝගා පුහුණුව සඳහා අයකරනු ලබන ගාස්තුව රු.5000.00 ලෙස ගැනීම සුදුසු බවට යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සේවක සුභ සාධක සංගමයේ වැඩ කටයුතු සඳහා අයවැය මඟින් 2020 වර්ෂයේ සිට අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින් ඒ සඳහා මුදලක් අනුමත කර දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා රු.300,000.00ක මුදලක් 2019 වර්ෂයේදී ලබා දී ඇති බවත්,නමුත් 2020 වර්ෂයේ සිට මෙය වෙන් කර නොමැති බවත් ඒ සඳහා යම් මුදලක් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සමස්ථ සේවක සංඛ්‍යාව 340 පමණ සිටින බවත්,පණතෙන්ම මේ සඳහා ලබා දීමට බලය තිබෙන බවත්,සෑම අයවැයකටම මෙය ඇතුළත් කර මුදල ලබා දෙන බවත්,2019 වර්ෂයේ දී ලක්ෂ තුනක් ලබා දුන් බවත්,මේ වසරේ අවුරුදු උත්සවයක් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.සාමාජික මුදලින් ණය ලබා දීගෙන යන බවත්,මරණාධාර කටයුතු,දරුවන්ගේ අධ්‍යාපන කුසලතා ඇගයීම වැනි කටයුතු සිදු කරගෙන යන බවත්,මේ සඳහා මුදලක් ලබා දීමෙන් මෙම විශේෂ වැඩසටහන් වැනි කටයුතු සිදු කිරීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.උත්සවයක් කරන විට පවුල් වල පිරිසද සමඟ 1000 පමණ එකතු වන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම වසරේ සේවක අභිප්‍රේරණය ලෙස ලක්ෂ අටක් වෙන් කර තිබෙන බවත්,එම මුදලින් යම් මුදලක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ලක්ෂ 06ක් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.තමන්ද මේ සඳහා පෞද්ගලිකව සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

තමන්ද සහයෝගය ලබාදෙන බවට ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 08<br><br>මේ සම්බන්ධයෙන් ගරු මහා සභාව දීර්ඝව සාකච්ඡා කල අතර මෙම සංගමය අප සභාවේම සේවක මහත්ම මහත්මීන්ගේ හා නිලධාරීන්ගේ සංගමයක් බවත් සාකච්ඡා කරන ලදී. මේ සඳහා රු.600,000.00ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

v. මැටිකොටුව පන්සල් භූමියේ ඉදිකර ඇති පෙර පාසල් ගොඩනැඟිල්ල අබලන් තත්ත්වයේ පවතින බව දන්වා එවා ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කර දීම සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

මෙම පෙර පාසල මැටිකොටුව පන්සල් භූමියෙන් ඉවත් කර කට්ටි කිරීමේදී එම ප්‍රදේශයෙන්ම ලැබුණ ඉඩමක් තිබෙන බැවින් එහි ස්ථාපිත කරන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙහි කිසිවක් නවීකරණය නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

එම සභාව සතු ඉඩමට ඉහළින් ඇති ඉඩමේ වතුර නොබසින ගැටළුවක් තිබෙන බවත්,එම ඉඩමේ සිට ජලය බැසීමට කාණුවක් දමා ඇති බවත් එහි ගැටළුවක් තිබෙන බවත් එය සොයා බලා කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

එම ස්ථානයේ කර්මාන්ත ශාලාවක් තිබෙන බවත් එහි ශබ්දය දරුවන්ට බලපාවිදැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එහි දී විශාල ශබ්දයක් ජනනය නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 09 |
|---|
| මැටිකොටුව පන්සල් භූමියේ ඉදිකර ඇති පෙර පාසල් ගොඩනැඟිල්ල අබලන් තත්ත්වයේ පවතින බව දන්වා එවා ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු නොවන බවත්,නව ස්ථානයක (කට්ටි කිරීමේදී එම ප්‍රදේශයෙන්ම ලැබුණ ඉඩමක) එය ස්ථාපිත කිරීම සුදුසු බවත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

vi. දන්කොටුව පොදු වෙලඳපොල අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාල යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

පොළට මුරකරුවෙකු යොමු කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 10 |
|---|
| දන්කොටුව පොදු වෙලඳපොල අබලන් තත්ත්වයේ පසුවන බැවින් එම අළුත්වැඩියා කටයුතු සිදු කර දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

vii. දන්කොටුව නගර ශාලාවේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාල යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී කොඩි කණු සඳහා සුදු යකඩ යොදා ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම ඇස්තමේන්තු කර්මාන්ත කමිටුවට යොමු කරන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 11 |
|---|
| දන්කොටුව නගර ශාලාවේ තාප්පය තීන්ත ආලේප කිරීම (boundary wall) , බැමි සකස් කිරීම සහ කොඩි කණු සිටුවීම යන කර්මාන්තයන් සිදු කිරීම සුදුසු බවටත් එම වැඩ කටයුතු පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

viii. මාර්ග අංක NWP /WEP /C30/2-කිරිමැටියාන හුන්දිරාපොල පාර වම් පස 01 පාර (රණවි දුෂ්මන්ත මහතාගේ නිවස පාර) මැනුම් කටයුතු සිදු කර ගැසට් කර ඇති නමුත් එය නිවැරදිව ගැසට් කර නොමැති බැවින් නිවැරදි දුර ප්‍රාමණය නැවතත් ගැසට් කිරීමට අදාල යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 12

මාර්ග අංක NWP /WEP /C30/2-කිරිමැටියාන හුන්දිරාපොල පාර වම් පස 01 පාර (රණවි දුෂ්මන්ත මහතාගේ නිවස පාර) මීටර් 430 ලෙස ගැසට් කර ඇති බවත්,නමුත් මාර්ගයේ මුළු දුර මීටර් 540 වන බැවින් ඉතිරි මීටර් 110ක දුර ප්‍රමාණය නැවතත් ගැසට් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ix. 7073 අංක දරණ ඔප්පුව හා 10874 අංක දරණ පිඹුරට අනුව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු ලිහිරියාගම සතිපොළ භූමියේ එකී සතිපොළට යාබදව අළුතින් ඉදි කරන ලද අංක 01 සිට 06 දක්වා වන කඩ කාමර පද්ධතියේ පහත සඳහන් කඩ කාමර වල එකී බදු කරුවන් ගෙවීම පැහැර ඇති බැවින් හිඟ මුදල් ගොඩනැඟී ඇති අතර එබැවින් එම කඩ කාමර නැවතත් ප්‍රසම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| අ/අ | විස්තරය | බදුකරු | මාසික කුළිය රු. | 2022-12-31 දිනට හිඟ මුදල |
|---|---|---|---|---|
| 1 | කඩ කාමර අංක 01 | නිලන්ත කුමාර විජේසිංහ | 2700.00 | 24590.00 |
| 2 | කඩ කාමර අංක 02 | ප්‍රදීප් චානක පෙරේරා | 2700.00 | 41040.00 |
| 3 | කඩ කාමර අංක 03 | ශෙහාන් මධුසංක | 3000.00 | 45600.00 |
| 4 | කඩ කාමර අංක 04 | ශෙහාන් මධුසංක | 3000.00 | 45600.00 |
| 5 | කඩ කාමර අංක 05 | ෂෙල්ටන් ප්‍රනාන්දු | 3000.00 | 54600.00 |
| 6 | කඩ කාමර අංක 06 | කාන්තා ස්වයං රැකියා වෘත්තිකයන්ගේ සංගමය | - | - |

මේවා නීත්‍යානුකූල බදු ගිවිසුම් වලින් ගොස් ඇති බැවින් ඒවා අය කර ගැනීමට හැකි වන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කඩ කාමර අංක 05 හි වර්තමාන බදුකරුගේ රෝගී තත්ත්වය මත ඔහුගේ ඉල්ලීම පරිදි ඉදිරියේදී හිඟ මුදල් ගෙවාගෙන යන බව පැවසූ බවත් එය හැර අනෙක් කඩකාමර සඳහා මම අනුමැතිය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම පුද්ගලයාගෙන් මෙම ඉඩමද මිල දී ගත් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අප සභාවේ වර්තමාන ලේකම් මහතා මින් පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන විට නඩු දමා එම මුදල් අය කිරීම් සිදු කල බවත්,මෙම සභාවටද අය වීමට තිබෙන මුදල් ඒ ආකාරයෙන් නඩු පවරා හෝ අයකරගන්නා ලෙස තමන් යෝජනා කරන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

නඩු දමා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙවැනි හිඟ මුදල් අය කිරීම සම්බන්ධයෙන් නඩු දමා නොමැති බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

නඩු දැමීමට නොව මෙම කඩ කාමර හරියාකාරව ලබා නොදීම මෙහිදී සිදු වන බවත්,වෙන්නප්පුව නගරයේ නත්තල් කාලයට තාවකාලික කඩ කාමර ලබා දෙන විට එම මුදල ඔවුන්ගෙන් අය කර ලබා දෙන ලෙසට සාකච්ඡා කර තිබූ බවත්,එක් වසරක් එය සිදු වූ බවත් ඉන්පසුව නැවතත් දෙවන වසරේ සිට පැරණි ආකාරයටම ඉල්ලුම් කරන සෑම දෙනාටම ලබා දුන් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.අවසානයේදී සභාවට රු.හත් අටදාහ අය කරගැනීමටත් නඩු දැමීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.පසුගිය වසරේද එක් කඩ කාමරයකින් මුදල් ගෙවා නොමැති බවත් ඒවා සඳහා නඩු දැමුවහොත් නඩුවට වඩා අය වීමට තිබෙන මුදල අඩු මුදලක් බවත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා මුලදීම ක්‍රමවේදයක් සකසා දුන් බවත් නමුත් ඒවා සිදු නොකර නැවතත් එක් එක් කෙනාගේ ඉල්ලීම් මත මේවා සිදු කල බවත්, මේවා සිදු වනුයේ ක්‍රමවේදයෙන් පිට යන නිසා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ වන විට මස් කඩද එවැනි ආකාරයට තිබෙන බවත් සභාවේ අදෙයෙම් පිළිබඳව සාකච්ඡා කරන්නේ නම් අයකරගත යුතු ආදායම් අයකර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.වසරක් කඩය සිදු කර දමා ගොස් නැවතත් වෙනත් නමකින් පැමින කඩ මිල දී ගන්නා බවත් මේවා පිළිබඳව ඉදිරියේදී ලේකම් මහතාගේ අවධානයද යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.මේවා දැනටත් සභා ගත වී කමිටු වලට පැමිණි කාරණා බවත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව දැනට සභාවේ දන්කොටුව හා වෙන්නප්පුව වෙලඳ සංකීර්ණ වල කඩ කාමර වල හිඟ මුදල් තිබෙන බවත්,ඊට අමතරව ලිහිරියාගම මේ වන විට තිබෙන බවත්,මේවා සලකා බලන විට දන්කොටුව ප්‍රශ්නය පිළිබඳව වෙනම වාර්තාවක් තිබෙන බවත්,වැඩ කටයුතු පවත්වාගෙන යන කඩ කාමර වල එවැනි ගැටළුවක් තිබිය නොහැකි බවත් ගිවිසුම් ප්‍රකාරව මාස තුනකට වඩා තිබුණහොත් එම ගිවිසුම අවලංගු කර ඇප මුදලින් එම මුදල පියවා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී. සාමාන්‍ය ක්‍රියා පිළිවෙල එය බවත්,ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා පැවසූ කාරණයේදී සිදු වූයේ සහන කාලය ඉල්ලමින් ගොස් විශාල හිඟ මුදලක් ගෙවීමට තිබූ නිසා බැවින්යැයිද එවිට ගිවිසුම අවලංගු කර නඩු පැවරීමකට ගිය බවත් ප්‍රකාශ කරන ලදී.මේ වන විට සාමාන්‍ය ආකාරයේ තිබෙන කඩ කාමර වල ගිවිසුම් අවලංගු කර නැවත ටෙන්ඩර් කරන බවත්,මෙහි කඩ කාමර වසා ඇති බවත්,ඒවා පවත්වාගෙන යන කඩ කාමර නොවන බවත් වසර තුනකට ගෙන ඇති බවත්,මෙවැනි කඩ කාමර හඳුනාගෙන ඇති බවත්,එමෙන්ම මස් කඩ වලද ගරු මන්ත්‍රීතුමා පැවසූ පරිදි බදු කාලය අවසන් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.කොලින්ජාඩිය ප්‍ර දේශයේ මස් කඩය බදු ගන්නා පුද්ගලයාගේ සහෝදරයෙකු විසින් සිදු කරගෙන ගොස් ඇති බවත් එබැවින් එය කරන සහෝදරයාට තමන් ගිවිසුම අත්සන් කර නොදී එම හිඟ මුදල ගෙවීමට එකඟ වන ලෙසට පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එම සහෝදරයා වාරික ලෙස ගෙවීමට එකඟ වි ලිපිය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.නඩු 20ක් පමණ මේ වන විට තිබෙන බවත්,හොටල් වල කොළඹට ගෙන ගිය නඩුවද මේ වන විට අදාල පාර්ශවය ඉල්ලා අස් කරනෙ ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එතැනදී එම තීරණය සම්බන්ධයෙන් නැවතත් පරීක්ෂා කර බලන ලෙසත්,ප්‍රාදේශීය සභාව මඟින් නඩුවක් පැවරීමේදී මාස 6ක් තුළ පැවරිය යුතු බවට තම අවබෝධයේ තිබෙන බවත් ,එම මාස 6ක් අවසන් වන තෙක් නිලධාරීන් ඇස් පියාගෙන සිටී නම් ඒ සම්බන්ධයෙන්ද කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.නඩුවක් පැවරීමෙන් අප සමඟ ගණුදෙණු කිරීමට පැමිණෙන එම උදවිය ඔවුන්ටද නිවැරදිව කටයුතු නොකලහොත් නඩුවක් පැවරේයැයි සිතා නිසි ලෙස කටයුතු සිදු කරාවියැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

එම නඩුව ඉල්ලා අස් කරගත්තේ කුමන පදනම යටතේ දැයි වාර්තාවක් ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය ලබා ගන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල අධිකරණ තීන්දුව ක්‍රියාත්මකදැයිද, එය සභාගත කරගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. නඩුව ඉල්ලා අස් කරගත්තේ නම් නඩු තීන්දුවක් නොමැතිදැයිද විමසා සිටින ලදී.

මෙය හලාවත උසාවියේ නඩුව පවරා තිබියදී කොළඹට ගෙන ගිය බවත්,නැවතත් හලාවත අධිකරණයේ මෙම නඩුව ගෙන යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 13

කඩ කාමර අංක 05 හි වර්තමාන බදුකරුගේ රෝගී තත්ත්වය මත ඔහුගේ ඉල්ලීම පරිදි ඉදිරියේදී හිඟ මුදල් ගෙවා පවත්වාගෙන යාමට ඔහුට තවදුරටත් අවස්ථාව ලබා දීම සුදුසු බවත්, පහත සඳහන් කර ඇති පරිදි අවම ලංසුව හා ආපසු ගෙවන ලංසු තැන්පතුව අනුව සෙසු කඩ කාමර විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මඟින් ප්‍රසම්පාදනය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

| කඩ කාමරය | වර්ග අඩි ප්‍රමාණය | අවම ලංසුව(මාසික කුලිය) රු. | ආපසු ගෙවන ලංසු තැන්පතුව රු. |
|---|---|---|---|
| කඩ කාමර අංක 01 | 108 | 2,600.00 | 3,500.00 |
| කඩ කාමර අංක 02 | 108 | 2,600.00 | 3,500.00 |
| කඩ කාමර අංක 03 | 108 | 2,600.00 | 3,500.00 |
| කඩ කාමර අංක 04 | 132 | 2,950.00 | 3,500.00 |
| කඩ කාමර අංක 06 | 108 | 2,600.00 | 3,500.00 |

## b. ගරු මන්ත්‍රී යෝජනා

i. ගෝනවිල පොදු වෙලඳපොල ගොඩනැඟිල්ලේ වහලය මතට ගසක් කඩා වැටීම හේතුවෙන් අබලන් වී ඇති වහලය පිළිසකර කිරීම සහ එම පොදු වෙළඳපොල කඩ කාමර බදු ගෙන ඇති බදු හිමියන් භාවිතා කරන වැසිකිළිය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 14

ගෝනවිල පොදු වෙලඳපොල ගොඩනැඟිල්ලේ වහලය මතට ගසක් කඩා වැටීම හේතුවෙන් අබලන් වී ඇති වහලය පිළිසකර කිරීම සහ එම පොදු වෙළඳපොල කඩ කාමර බදු ගෙන ඇති බදු හිමියන් භාවිතා කරන වැසිකිළිය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## 04. කාරක සභා වාර්තා සලකා බැලීම.

**i.** 2023-02-14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 15

2023-02-14 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

**ii.** 2023-02-03 හා 2023-02-17 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම

තීරණ අංක 16

2023-02-03 හා 2023-02-17 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මියගේ හා ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

**iii.** 2023-02-17 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 17

2023-02-17 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

**iv.** 2023-02-23 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

පරිසර කමිටුවේ යෝජනාවක් තිබෙන බවත්,සූර්ය පැනල සවි කිරීමට යෝජිත වහල දෙකට අමතරව සභාවේ අනෙකුත් වහලවල් සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමක් සිදු කර සූර්ය බලාගාර බවට පත් කර ගනිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මෙමඟින් සභාවට ප්‍රයෝජන ගන්නා ලෙසම රටටද මෙමඟින් පරිසරය ආරක්ෂා කර ප්‍රයෝජනයක් ලැබෙන බවත් මේ සඳහා කඩිනමින් වැඩ කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

සූර්ය පැනල සම්බන්ධයෙන් කතා කිරීමේදී අපට ලබා දීමට යෝජිත මුදල ලබා දෙන බවට මේ මොහොතේ තමන්ට පනිවිඩයක් ලැබුණ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා අනුමැතිය ඉල්ලා දීර්ඝ කලක් ගතවන බවත්,මෙවැනි දෙයක් වාර්තා කර මහජන අවධානයට යොමු කර මෙය ඉක්මනින් සිදු කර ගැනීමට යම් ක්‍රමවේදයක් තිබේදැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

තීරණ අංක 18

2023-02-23 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ සහ ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

**v.** 2023-03-03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 19<br><br>2023-03-03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

**vi.** 2023-03-04 වන දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරිමේ කාරක සභා වාර්තාව සලකා බැලීම

ලබන සතිය ඇතුළත ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය සඳහා තීන්ත ආලේප කිරීමට සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ආරාධනා කර උත්සවයක් සංවිධානය කිරීමට කටයුතු කරන ලෙසත්,එම ලබා දුන් සහයෝගය තමන් ඉතාමත් අගය කරන බවත් ගරු සභාපතිතුමා විසින් ක්‍රීඩා කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට පවසා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 20<br><br>2023-03-04 වන දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරිමේ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

## <u>05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම</u>.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2023 ජනවාරි මස**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2023 ජනවාරි මස**

2023 වර්ෂයේ ජනවාරි මාසයේ වරිපනම් බදු රු.4,628,427.81ක් වරිපනම් බදු එකතු වී ඇති බවත්,වරිපනම් සීමාව වැඩි කර ඇති බැවින් 2022 ජනවාරි මාසයේ රු.4,620.185.04 එකතු වී ඇති බවත්,වැඩි වීමක් සිදු වී නොමැති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

වරිපනම් සීමාව පුළුල් කලද මුදල් එකතු කිරීම ආරම්භ කර නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව වරිපනම් සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රීවරන්ද වරිපනම් එකතු කිරීම සම්බන්ධයෙන් තොරතුරු විමසා සිටින ලදී.

තීරණ අංක 21

2023 ජනවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය සත්‍ය වාර්තා බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2023 පෙබරවාරි මස ඉන්ධන හා වාහන නඩත්තුව සම්බන්ධ වාර්තාව හා 2022 වර්ෂයේ සම්පූර්ණ වියදම් වාර්තාව සලකා බලන ලදී.

iv. දන්කොටුව ප්‍රාදේශීය මහලේකම් ප්‍රදේශයට අයත් ඉඩම් වල මැනුම් කටයුතු පිළිබඳ වර්තමාන තත්ත්වය සම්බන්ධ වාර්තාව සලකා බැලීම

මේ සම්බන්ධයෙන් තමන් ආණ්ඩුකාරතුමන් සමග සාකච්ඡා කල බවත්, හැකි ඉක්මනින් එම කටයුතු සිදු කර දෙන බවට එතුමා පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් සම්බන්ධයෙන් වාර්තාවක් එවා ඇති බවත්,දන්කොටුව උප කාර්යාල භූමිය මැනුම් කටයුතු සිදු කර ඇති බවට එවා ඇති ලිපියේ සඳහන් වන බවත්,ඉන්පසුව සෑම ඉඩමක්ම මැනුම් ඉල්ලීම් යොමු කිරීමට නියමිත බවට සඳහන් කර ඇති බවත්,එම කටයුතු සිදු වන්නේ කෙදිනදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදි.

මිනින්දෝරුවන් රජයේ මිනින්දොරුවන් වී පැමිණි පසුව ටික කලෙකින් ඔවුන් එමඟින් ඉවත් වී පෞද්ගලිකව එම කටයුතු සිදු කරන බවත්,මේ වන විට මිනින්දොරුවන් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙය සභාවේ ගැටළුවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මෙය පෞද්ගලිකව මැනුම් කටයුතු සිදු කලද විශාල මුදලක් යන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා සමඟ කතා කල බවත්,විශේෂ මිනුම් කණ්ඩායමක් දමා මෙම කටයුතු සිදු කිරීමට එහිදී ආන්ඩුකාරතුමා අනුමැතිය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී සි.පී.සරත් වික්‍රමරත්න මහතා සහ ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාද අදහස් ඉදිරිපත් කරන ලදී.
ජයකොඩි ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් ද මෙම වාර්තාවේ සඳහන් වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය මැනුම් කර නොමැත්තේ නඩුවක් තිබෙන නිසා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කටයුතු වලට බාධා වන අන්දමේ නඩුවක් මෙහි නොමැති බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ආණ්ඩුකාරතුමාට පැවසූ කාරණය කෙදින සිට ක්‍රියාත්මක වේදැයිද ගරු මන්ත්‍රී සි.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.මෙහිදී "යෝගියාන සුසාන භූමියේ පැවරුම් නියෝගය ලියාපදිංචිය සඳහා යොමු කොට ඇත" ලෙස සඳහන් වන බවත්,මෙය සිදු කල දිනය සඳහන් කර නොමැති බවත්,ලේකම් මහතා ඉල්ලීමක් සිදු කලේ නම් මේ සඳහා නිවැරදිව තොරතුරු ඔවුන් සැපයිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.මෙම කාරණය සඳහා අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

දුම්මලකොටුව ඉඩම් කොටසේ ගැටළුව පිළිබඳව පසුගිය සභාවලද කතා කර බවත්, ඒ පිළිබඳ තත්ත්වය ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එහි කොමසාරිස්තුමා විසින් අනුමැතියක් ලබා දී නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සූර්ය පැනල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මේ වන විට සූර්ය පැනල සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලදී.

මෙහි මුදල් වෙනස් විය හැකි බවත්,මේ සම්බන්ධයෙන් ගිවිසුම ඉක්මනින් අත්සන් කල යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඔවුන්ගේ ඇස්තමේන්තුවේ මේ සඳහා කාලයක් සඳහන් කර ලබා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. සෑම සභා වාරයකදීම මෙහි ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 22<br><br>දන්කොටුව ප්‍රාදේශීය මහලේකම් ප්‍රදේශයට අයත් ඉඩම් වල මැනුම් කටයුතු පිළිබඳ වර්තමාන තත්ත්වය සම්බන්ධ වාර්තාව සලකා බලන ලදී. |

v. රජයේ ගිණුම් කාරක සභාව විසින් 2020 වර්ෂය සඳහා පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා වලට අදාල වාර්තාව සලකා බැලීම

මේ සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලෙස වෙනම හයිලයිට් කර එවා ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. මෙම වාර්තාවේ සම්බන්ධ කරුණු සම්බන්ධයෙන්ද විමසා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 23<br><br>රජයේ ගිණුම් කාරක සභාව විසින් 2020 වර්ෂය සඳහා පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා වලට අදාල වාර්තාව සලකා බලන ලදී. |

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). වයඹ ප්‍රධාන අමාත්‍යාංශ විගණන කමිටුවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම යටතේ වෙන්නප්පුව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය සතු ඉඩමේ අයිතිය අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම

මේ සම්බන්ධයෙන් තමන් ආණ්ඩුකාරතුමා සමඟද සාකච්ඡා කල බවත්,2015දී මේ සඳහා ඉඩම ලබා දුන් බවත්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුදලක් ලබාදෙන ලෙසට ඉල්ලුවද ඔවුන් සෑම විටම එය ප්‍රත්ක්ෂේප කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයට විශාල මුදලක් එකතු නොවන බැවින්ද, මෙය දරුවන්ට දෙන දෙයක් බැවින් නිශ්චිත මුදලක් අය කර මෙය ලබා දෙන ලෙසට තමන්ට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

පලාත් පාලන දෙපාර්තමේන්තුව සතු දේපල අන්සන්තක කිරීමේ ක්‍රමවේදයක් තිබෙන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ දේපල බදු ලබා දීමට හැකි බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය බදු ලබාගොදුන්නත් ගැටළුවක් නොවන බවත්,නමුත් අපගේ අයිතිය ගිවිසුම්ගත කර ගත යුතු බවත්,ඒ සඳහාද ඔවුන් අකමැති බවත්,ඉඩමේ හොඳම ස්ථානය ඔවුන් ලබාගෙන ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා අඩු බදු මුදලකට ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාව සතු දේපල වෙනත් අමාත්‍යාංශ සතු කිරීමට හැකි බවත්, ලුණුවිල ජල සම්පාදන අමාත්‍යාංශයට සභාව සතු ඉඩමක පර්චස් 40ක් ප්‍රාදේශීය ලේකම් හරහා අමාත්‍යාංශ සතු කර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.එලෙස මෙයත් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා මින් පෙර තීරණයක් ගෙන ඇති බවත් නැවතත් විධිමත් බදුගිවිසුමකට ගොස් නාමික බදු මුදලක් අය කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙම ඉදිරිපත් කර ඇති ලිපියේද සාකච්ඡා කරන ලෙසට පමණක් සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මෙවැනි තීන්දුවක් මහා සභාවේ අනුමත කර දුන් පසුව කොමසාරිස්තුමා හරහා පලාත් ප්‍රදාන අමාත්‍යවරයාට ගොස් එකඟතාවය ගෙන කටයුතු කල බවත්,මේ වන විට එලෙස කිරීමට හැකියාවක් නොමැති බවත්,පසුගිය යහපාලන ආණ්ඩුව කාල සීමාවේදී ආණ්ඩුකාරයාට තිබූ ක්‍රමවේදයත් ෆයිසර් මුස්තාපා නීතිඥතුමා මධ්‍යම ආණ්ඩුවට පවරා ගත් බවත් එතැනට යන තෙක් මෙම ක්‍රමවේදය යා යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.මෙය ලබා දිය හැකි පහසුම ක්‍රමවේදය බදු ලබා දීම බවත් ප්‍රකාශ කරන ලදී.

මාසයකට රු.30,000ක් ලෙස තක්සේරුව එවා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අධ්‍යාපනයට සභාව මඟින් සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එම මුදල අඩු කර දෙන ලෙසට ඔවුන්ට ඉල්ලීමක් සිදු කරන ලෙසට පවසන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 24

මේ සම්බන්ධයෙන් ගරු මහා සභාව සාකච්ඡා කරන ලදී.මේ සඳහා විධිමත් බදු ගිවිසුමකට යාම සුදුසු බවත්,වාර්ෂිකව සහන බදු මුදලක් යටතේ ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

(ii). 2023-03-19 වන දින නිල කාලය අවසන් වන බව පවසා මන්ත්‍රී දීමනාව අඩකින් අඩු කර ඇති බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.මෙම දීමනාව මහා සභාවට ගෙවන බවත්,මෙම මාසයේ මහා සභාව පැවැත්වූයේ නම් එම දීමනාව ගෙවිය යුතු බව තම අදහස බවත් ප්‍රකාශ කරන ලදී.මින් පෙරද මාසය අවසන් වීමට පෙර මහා සභා නිල කාලය අවසන් වී ඇති බවත් ඒ සෑම අවස්ථාවකදීම දීමනාව ගෙවා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

දෛනිකව අත්සන් නොගන්නා බවත්,සභාවේ සේවකයින් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙය ගෙවීමට තමන් එකඟ බවත් නමුත් දින 19 පමණක් මුදල් ප්‍රතිපූර්ණය කරන බවට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

මහා සභාවෙන් අනුමත කරන දේ දින 19 පමණක් වලංගු වේදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම කණගාටුවෙන් මතක් කල යුතු තවත් කාරණයක් තිබෙන බවත්,ගරු සභාපතිතුමා තුන්වන හෝ හතර වන මහා සභාවේදී සමූහ ඡායාරූපයක් ගත් බවත්,තමන් විටෙන් විට ඒ පිළිබඳව මතක් කල

බවත්,නමුත් තවමත් එම පින්තූරය නොලැබුණු බවත් ගරු මන්ත්‍රී යූ.පුද්ධ එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 25

ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඡායාරූපය සියළුම මන්ත්‍රීවරුන්ට ලබාදෙන ලෙසට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

(iii). වෙන්නප්පුව පොදු වෙළඳපොල භූමිය ඉදිරිපස ඇති තාවකාලික කඩ කාමර දෙක ඉවත් කර එම ස්ථානයේ රථ ගාලක් ස්ථාපිත කිරීමට අදාල යෝජනාව ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 26

වෙන්නප්පුව පොදු වෙළඳපොල භූමිය ඉදිරිපස ඇති තාවකාලික කඩ කාමර දෙක ඉවත් කර එම ස්ථානයේ රථ ගාලක් ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

(iv). 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සමඟ කියවිය යුතු 2020-10-29 දින අංක 2199/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) පල කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 06 ප්‍රකාරව 2024 වර්ෂය සඳහා වන අයවැය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා පුවත්පත් දැන්වීමක් මඟින් මහජනතාවගෙන් නව සංවර්ධන යෝජනා 2023 ජුනි 30 වන දිනට පෙර ලබා ගැනීමට අදාල යෝජනාව ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 27

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සමඟ කියවිය යුතු 2020-10-29 දින අංක 2199/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) පල කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 06 ප්‍රකාරව 2024 වර්ෂය සඳහා වන අයවැය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා පුවත්පත් දැන්වීමක් මඟින් මහජනතාවගෙන් නව සංවර්ධන යෝජනා 2023 ජුනි 30 වන දිනට පෙර ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

(v). ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පවරා නොගත් ඉඩම් පිළිබඳව කතා කිරීමේදී පුස්තකාල යටතේ නැ/කහටවිල මහායායවත්ත අංක දෙක ඥානරතන ඉෂ්ඨවීර අනුස්මරණ පුස්තකාලයේ ඉඩම මෙතැනට ඇතුළත් වී නොමැති බවත්,එමෙන්ම මැ/කිරිමැටියාන ප්‍රජා ශාලාව පිහිටි ප්‍රදේශය ලෙස පොතුවටවන සඳහන් වී ඇති බවත් ,එය සංශෝධනය විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මීට අමතරව සභාවට අයත් හෝ සභාව පරිහරණය කල භූමියක් තිබේ නම් සභාව දැනුවත් කරන ලෙසත්,මෙහි සඳහන් කර ඇති බුජ්ජම්පොල පුස්තකාලය සභාවට අයත් බවත්,රණසිංහ ඉස්කෝලමහත්තයා ට්‍රෙවින් ප්‍රනාන්දු සභාපතිතුමා සිටියදී සභාවට පැමිණ ඔවුන්ගේ පෞද්ගලික දේපලක් සභාවට ලියා දුන් බවත් ,එය රජයේ දේපලක් නොවන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

(vi). 2023 වර්ෂයේ පළමු පරිපූරක ඇස්තමේන්තුව අනුමත කර ගැනීමට අදාල යෝජනාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 28<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කුඩා පරිමාන කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ පැරබෝට්ටා වී වගා ව්‍යාපෘතිය මඟින් ලැබෙන රු.1,400,000.00ක ආධාර මුදලින් මාර්ග සංවර්ධනය යටතේ කිරිමැටියාන කුඩළු වැව මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා යෙදවීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී. |

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.